# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/15 - 2012 දෙසැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2012.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වැනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි වගන්තිය සමග කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ, 2012 ඔක්තෝබර් මස 04 වැනි දින අංක 1778/32 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් 05 වැනි දින අංක 1465/20 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය 2013.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

මහින්ද රාජපක්ෂ,<br>ජනාධිපති.

2012 දෙසැම්බර් මස 18 වැනි දින,<br>කොළඹ 01,<br>මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

එම උපලේඛනයේ 7 වැනි අයිතමයට ඉක්බිතිවම පහත සඳහන් නව අයිතමය එකතු කිරීමෙන් :-

"7 අ. යම් තැනැත්තකු විසින් අන්තර් වෙළඳ ගිණුමකට (ස්ලැෂ් ගිණුමකට) හෝ එවැනි ගිණුමක සිට යම් තැනැත්තෙකුට කොටස් පැවරීමේ යම් සාධන පත්‍රයක් ;"

01 - 382

1A - PG 01494 — 2035 (2012/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.